මුදල් කොමිෂන් සභාවේ

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

වැය ශීර්ෂය අංක 011

මුදල් කොමිෂන් සභාව
අංක.03, සරණ මාවත, රාජගිරිය

අන්තර්ගතය

පිටුව

පරිච්ඡේදය-01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය 1

පරිච්ඡේදය-02: ප්‍රගතිය සහ අනාගත දැක්ම 8

පරිච්ඡේදය-03: 2024 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය 24

පරිච්ඡේදය-04: කාර්යසාධන දර්ශක 35

පරිච්ඡේදය-05: තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය 36

පරිච්ඡේදය-06: මානව සම්පත් පැතිකඩ 39

පරිච්ඡේදය-07: අනුකූලතා වාර්තාව 43

පරිච්ඡේදය-01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය

1.1 හැඳින්වීම

1.1.1 පසුබිම

1987 වර්ෂයේ දී සම්මත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් පළාත් සභා සහ මුදල් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වන ප්‍රතිපාදන සලසා ඇත. පළාත් වෙත සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, එමගින් පළාත් සභාවලට සිය සේවා සැපයීමට පහසුකම් සලසා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ දක්වා ඇති පරිදි මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් වන්නේ, සම්පත් අවශ්‍යතා පිළිබඳව සහ රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පළාත් නවය අතර වාර්ෂික අයවැයෙන් වෙන් වන අරමුදල් බෙදා හැරීම පිළිබඳ මූලධර්ම සකස් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට සිය නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

1.1.2 මුදල් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ ව්‍යවස්ථාව මගින් මුදල් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වන ප්‍රතිපාදන සඳහන් වන අතර, එහි කාර්යභාරය ද පැහැදිලි කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3),(4) සහ (5) අනුව්‍යවස්ථාවන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත පරිදි වේ.

> **154ජ (3) අනුව්‍යවස්ථාව:** පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය.
>
> **154 ජ (4) අනුව්‍යවස්ථාව:**
>
> (අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති; සහ
>
> (ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේය.
>
> **154 ජ (5) අනුව්‍යවස්ථාව:** රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර, ඒ අනුව,
>
> (අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;
>
> (ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;
>
> (ඇ) විවිධ පළාත් අතර සමාජ හා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව; සහ
>
> (ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර ඉහළම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව, සැලකිල්ලට ගත යුත්තේය.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලැබීමෙන් පසු, ගරු ජනාධිපතිතුමා විසින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව 154 ජ (7) අනුව්‍යවස්ථාව අනුව, ගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ හා එම නිර්දේශ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

1.1.3 වත්මන් මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින්

154ජ(1) වගන්තියට අනුව, මුදල් කොමිෂන් සභාව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර වත්මන් සාමාජිකයින් පහත පරිදි වේ.

i. සුමිත් අබේසිංහ මහතා - සභාපති
ii. ආචාර්ය පී.නන්දලාල් වීරසිංහ මහතා - සාමාජික (නිල බලයෙන්) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති
iii. කේ.එම්.මහින්ද සිරිවර්ධන මහතා - සාමාජික (නිල බලයෙන්) සහ භාණ්ඩාගාර ලේකම්
iv. එම්. වාමදේවන් මහතා- සාමාජික
v. ටී. නලීන් ඔෂෙන් මහතා - සාමාජික

1.2 මුදල් කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර, අරමුණු

මුදල් කොමිෂන් සභාව සිය උපායමාර්ගික සැලැස්ම සකස් කර එය 2021 සිට 2024 දක්වා කාලය සඳහා යාවත්කාලීන කර ඇති අතර, එම සැලැස්ම තුළ දැක්ම, මෙහෙවර සහ අරමුණු පැහැදිලිව හඳුනාගෙන නිර්වචනය කර ඇත.

දැක්ම

තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහිත සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්

මෙහෙවර

රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම හා පළාත් සභාවන්ට අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳ මූලධර්ම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

මුදල් කොමිෂන් සභාවේ අරමුණු

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය සපුරාලීම.
2. පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා දීම සඳහා නිර්දේශ කිරීම.
3. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කර ගනිමින් පළාත් අතර මූල්‍ය සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කිරීම.
4. වෙන් කර දෙනු ලැබූ අරමුදල් විචක්ෂණශීලීව වැය කරන බව තහවුරු කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ යොමු කිරීම.

1.3 මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල අනුව, මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වන්නේ, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟා කර ගැනීමේ අරමුණින් පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂිකව ජාතික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම පිළිබඳව සහ එම අරමුදල් පළාත් නවය අතර බෙදා හැරිය යුතු ආකාරය පිළිබඳ නිර්දේශ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමයි.

මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

i. පළාත් සභාවල වාර්ෂික සම්පත් අවශ්‍යතා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ සැපයීම.
ii. පළාත් බලධාරීන් සමඟ පවත්වනු ලබන සවිස්තරාත්මක සාකච්ඡාවලින් අනතුරුව, පළාත් සභාවල අවශ්‍යතා තක්සේරු කිරීම.
iii. ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා අවශ්‍ය අරමුදල් පිළිබඳව නිර්දේශ කිරීම සහ අයවැයෙන් වෙන් කර දෙනු ලබන මුදල් පළාත් අතර බෙදා දීම පිළිබඳ මූලධර්ම පිළිබඳව ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

iv. ගරු ජනාධිපතිතුමාගේ/ආණ්ඩුවේ අනුමැතිය ලැබීමෙන් පසු, ජාතික අයවැය මගින් වෙන් කරන ලද අරමුදල් පළාත් සභාවන්හි විවිධ අංශ අතර බෙදා හැරීම.

v. අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීමට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම.

vi. අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කර, ඒවා ඇතැම් සංශෝධනවලට යටත්ව ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දීම.

vii. පළාත් සේවක සංඛ්‍යාව කළමනාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ සැපයීම.

1.4 ආයතනයේ ප්‍රධාන අංශ

මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරී සහ උපකාරක අංශවලින් කොමිෂන් සභා කාර්යාලය ව්‍යුහගත කර ඇත.

- පළාත් සංවර්ධන සැලසුම් අංශය
- පළාත් ආදායම්, පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය
- ප්‍රතිපත්ති, අධ්‍යයන සහ වාර්තාකරණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

1.4.1 මුදල් කොමිෂන් සභාවේ අංශවල කාර්යයන්

අ. පළාත් සංවර්ධන සැලසුම් අංශය

1. වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.
2. මුදල් කොමිෂන් සභා නිර්දේශවලට ඇතුළත් කිරීම සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සහ ජාතික අයවැයෙන් වෙන් කරන ලද අරමුදල් පළාත් තුළ විවිධ අංශ අතර බෙදා හැරීම.
3. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
4. නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
5. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ එකී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දීම.

ආ. පළාත් ආදායම්, පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය

1. පළාත් පුනරාවර්තන අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.
2. එක් එක් පළාත් සභා, පළාත් පාලන ආයතන සහ පළාත් අධිකාරීවල පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා තක්සේරු කිරීම සහ ප්‍රදාන පළාත් අතර බෙදා හැරීම.
3. පළාත්වල අවශ්‍යතාවය අනුව අමතර ප්‍රතිපාදන නිර්දේශ කිරීම.
4. පළාත් සේවක සංඛ්‍යාව තීරණය කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
5. පළාත් අවශ්‍යතා සඳහා අක්මුදල් නිදහස් කිරීමේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
6. පළාත් ආදායම් තක්සේරු කිරීම සහ ආදායම් ඉලක්ක සැකසීම.

ඇ. ප්‍රතිපත්ති, අධ්‍යයන සහ වාර්තාකරණ අංශය

1. ගරු ජනාධිපතිතුමා වෙත මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සකස් කිරීමේදී කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට සහාය වීම.
2. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
3. පළාත් අතර අරමුදල් බෙදා වෙන්කිරීමට අදාළ මූලධර්ම හඳුනා ගැනීම.
4. අවශ්‍යතාවය අනුව අනෙකුත් කාලීන වාර්තා සකස් කිරීම.

ඇ. පාලන අංශය

1. මුදල් කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු කටයුතු - කාලීන වැටුප් වර්ධක නිර්දේශ කිරීම සහ අනුමත කිරීම, කාර්ය සාධන තක්සේරු කිරීම්, අදාළ නිලධාරීන්ගේ වත්කම් සහ වගකීම් එකතු කිරීම, වැන්දඹු හා අනත්දරු අරමුදල් කටයුතු, විශ්‍රාම වැටුප් කටයුතු සහ මරණ පාරිතෝෂික කටයුතු, උසස්වීම් හා මාරුවීම් කටයුතු.
2. නිවාඩු සම්බන්ධ කටයුතු - නිලධාරීන්ගේ සහ මුදල් කොමිෂන් සභා සාමාජිකයින්ගේ දේශීය සහ විදේශීය නිවාඩු කටයුතු, වැටුප් සහිත හෝ රහිත අධ්‍යයන නිවාඩු කටයුතු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ චක්‍රලේඛවලට අනුව අනෙකුත් අදාළ නිවාඩු කරුණු.
3. කාර්යාලයේ අදාළ නඩත්තු කටයුතු - ජලය, විදුලිය, දුරකථන, අන්තර්ජාලය, ආරක්ෂක සේවය, පිරිසිදු කිරීමේ සේවාව හා ගොඩනැගිලි නඩත්තු කටයුතු.
4. සියලුම ගෙවීම් අනුමත කිරීම - වැටුප්, උපාධිධාරී පුහුණු දීමනාව, අතිකාල, හතරෙන් එක ගෙවීම් සහ අනෙකුත් ගෙවීම්.
5. කොමිෂන් සභා සාමාජිකයින්ගේ සියලුම පරිපාලන කටයුතු.
6. නිලධාරීන්ගේ ණය කටයුතු - ආපදා ණය, උත්සව අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම්, දේපළ ණය හා අනෙකුත් ණය සම්බන්ධ කටයුතු.
7. මානව සම්පත් සංවර්ධන වැඩසටහන් - දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා නිලධාරීන් යැවීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සංවිධානය කිරීම.
8. අනෙකුත් පරිපාලන කටයුතු - නියමිත වේලාවට වාර්තා යැවීම.


ඉ. ගිණුම් අංශය

1. මූල්‍ය රෙගුලාසි, රජයේ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව මුදල් කොමිෂන් සභා කාර්යාලයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය සම්බන්ධයෙන් මූල්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම.
2. ප්‍රසම්පාදනයට අදාළ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය.
3. මුදල් කොමිෂන් සභා කාර්යාලයේ වත්කම් කළමනාකරණය.
4. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.
5. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම නියමිත සීමාවන් තුළ පවත්වා ගැනීම සහ ඒවායෙහි වාර්ෂික සැසඳුම් වාර්තා ඉදිරිපත් කිරීම.
6. මුදල් කොමිෂන් සභා කාර්යාලයට අදාළ අභ්‍යන්තර හා සාමාන්‍ය විගණන කටයුතු සහ රාජ්‍ය ගිණුම් කටයුතු හා සම්බන්ධ වීම.

ඊ. අභ්‍යන්තර විගණන අංශය

1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
2. මුදල් කොමිෂන් සභාවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිස අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සහ එවැනි පාලන පද්ධතිවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා නිසි පිළිවෙත් යෝජනා කිරීම.
3. ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, චක්‍රලේඛ සහ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන් කොමිෂන් සභා කාර්යාලයේ ක්‍රියාකාරී සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අනුකූලතාවය තක්සේරු කිරීම හා නිවැරදි කිරීම සහ වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.5 සංවිධාන සටහන



නි.අ/ස.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
පරි.නි. - පරිපාලන නිලධාරී
තො.සං.තා. නි. - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී
සංඛ්‍යා.නි. - සංඛ්‍යාලේඛන නිලධාරී

ස.ප.නි. - සහකාර පර්යේෂණ නිලධාරී
සං.නි. - සංවර්ධන නිලධාරී
ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
තො. සං.තා.ස. - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහයක
කා.කා.ස. - කාර්යාල කාර්ය සහයක

1.6 කොමිෂන් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

මුදල් කොමිෂන් සභාව යටතේ කිසිදු ආයතනයක් පිහිටුවා නැත. මුදල් කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ අනුව්‍යවස්ථාවේ උපලේඛනයේ දක්වා ඇති ස්වාධීන කොමිෂන් සභාවලින් එකකි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

මුදල් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති නොමැත.

අ) ව්‍යාපෘතියේ නම ආ) දායක නියෝජිතායතනය ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි. ඈ) ව්‍යාපෘති කාල සීමාව	අදාළ නොවේ

පරිච්ඡේදය-02: ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය

මුදල් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව සහ ක්‍රියාකාරී සැලැස්මේ අදාළ කාල රාමුවට අනුකූලව පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් 2024 වර්ෂය තුළ දී ඉටු කරන ලදි.

2.1.1. පළාත් ප්‍රාග්ධන අයවැයට අදාළ කරුණු

i. 2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සකස් කිරීමට අදාළ මාර්ගෝපදේශ පළාත් සභා වෙත නිකුත් කිරීම

2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ 2024 පෙබරවාරි 12 වන දින සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යවන ලදි. පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදල් අවශ්‍යතා පිළිබඳව ගරු ජනාධිපතිතුමාට සහ රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව එහි ව්‍යවස්ථාපිත නියමයන්ට අනුව පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා වාර්ෂිකව තක්සේරු කරනු ලබයි.

ii. 2024 පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පොදු ආකෘතියකට අනුව සකස් කරන ලද 2024 වර්ෂය සඳහා වන පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම්, 2024 වර්ෂයේ පෙබරවාරි මස මැද භාගය වන විට සියලුම පළාත් සභා වෙතින් මුදල් කොමිෂන් සභාව වෙත ලැබිණි. එක් එක් පළාත් සභාව විසින් ඉදිරිපත් කරන ලද මෙම වාර්ෂික සංවර්ධන සැලසුම්, මුදල් කොමිෂන් සභාව විසින් අධ්‍යයනය කරන ලද අතර, අමතර තොරතුරු අවශ්‍ය වන එම සැලසුම්වල ඇතැම් ක්ෂේත්‍ර පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සවිස්තරාත්මක සාකච්ඡා මාලාවක් පවත්වන ලදි. මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයා ඇතුළු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අනෙකුත් අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මෙම රැස්වීම් පැවැත්විණි.

වසරේ පළමු කාර්තුවේ දී සියලුම පළාත් සභාවල 2024 වසර සඳහා වන වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කරන ලද අතර, එම වාර්ෂික සංවර්ධන සැලැසුම්වල ක්‍රියාකාරකම් ලැයිස්තු සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණවලට අදාළ සංශෝධන කිරීමට යටත්ව සැලැසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාස දක්වා මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය එකඟතාව ලබාදෙන ලදි.

පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු දිනයන්, සමාලෝචන රැස්වීම් පැවැත් වූ දිනයන් සහ එම සැලසුම් සඳහා එකඟතාව ලබාදුන් දිනයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ;

වගුව 01: පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ලැබුණු දිනයන්, සමාලෝචන රැස්වීම පැවැත් වූ දිනයන් සහ එකඟතාව ලබාදුන් දිනයන්

පළාත	පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ලැබුණු දිනය	සමාලෝචන රැස්වීම පැවැත් වූ දිනය	සැලසුම් සඳහා එකඟතාව ලබාදුන් දිනය
උතුරු	2024.01.31	2024.02.14	2024.03.06
බස්නාහිර	2024.02.01	2024.02.16	2024.02.29
මධ්‍යම	2024.02.05	2024.02.15	2024.03.01
ඌව	2024.02.10	2024.02.21	2024.03.07
දකුණු	2024.02.16	2024.02.20	2024.02.27
වයඹ	2024.02.16	2024.02.26	2024.03.06
සබරගමුව	2024.02.16	2024.02.27	2024.03.11
උතුරු මැද	2024.02.21	2024.03.01	2024.03.13
නැගෙනහිර	2024.02.21	2024.03.05	2024.03.12

iii. පළාත් වත්කම් නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම - 2024 සමාලෝචනය කිරීම

රජය මුහුණපා ඇති වත්මන් මූල්‍ය අර්බුදය හේතුවෙන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු බොහොමයකට පවා ප්‍රාග්ධන ප්‍රදාන සීමා වී ඇති බැවින්, පළාතේ පවතින ප්‍රාග්ධන වත්කම් නිසි ලෙස නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන අරමුදල් ලබා දෙන ලෙස මුදල් කොමිෂන් සභාව විසින් රජය වෙත යෝජනා කරන ලදි. ඒ අනුව, පුනරාවර්තන වියදම් යටතේ එක් එක් පළාත් සභාව සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

එයට ප්‍රතිචාර වශයෙන් 2024 වර්ෂය සඳහා ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභා නවය සඳහා රු. මි. 15,000 ක් වෙන් කරන ලදි. මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව ප්‍රධාන අංශ සඳහා ප්‍රාග්ධන වත්කම් නඩත්තු සැලැස්මක් එක් එක් පළාත් සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලදී. සියලුම පළාත් සභාවල 2024 වර්ෂයට අදාළ නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් සමාලෝචනය කරන ලද අතර, පහත සඳහන් දිනවලදී මුදල් කොමිෂන් සභාව සිය එකඟතාව ලබා දෙන ලදි.

වගුව 02: නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් ලැබුණු දිනයන් සහ එකඟතාව ලබා දුන් දිනයන්

පළාත	නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු දිනය	එකඟතාව ලබාදුන් දිනය
උතුරු	2024.02.12	2024.03.22
බස්නාහිර	2024.02.16	2024.03.13
නැගෙනහිර	2024.02.21	2024.03.21
වයඹ	2024.02.29	2024.03.19
ඌව	2024.03.05	2024.03.25
උතුරු මැද	2024.03.07	2024.03.15
දකුණු	2024.04.02	2024.04.17
සබරගමුව	2024.04.02	2024.04.19
මධ්‍යම	2024.05.29	2024.06.10

iv. 2025 වසර සඳහා පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) සහ (4) අනුව්‍යවස්ථා අනුව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සකස් කිරීමේදී, ඉදිරි වසර සඳහා පළාත් සභාවල ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම පූර්ව අවශ්‍යතාවයකි.

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව පළාත් සභා විසින් ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සකස් කර ඉදිරිපත් කරන ලදි. 2024 ජුනි මාසය වන විට පළාත් සභා සඳහා අරමුදල් අවශ්‍යතා පිළිබඳව රජයට තාර්කික නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස එම ඉල්ලීම් සමාලෝචනය කරන ලදි.

වගුව 03: පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ඉල්ලීම් ලැබුණු දිනයන්

පළාත	පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ඉල්ලීම් ලැබුණු දිනය
බස්නාහිර	2024.03.26
දකුණු	2024.04.02
නැගෙනහිර	2024.04.08
මධ්‍යම	2024.04.17
ඌව	2024.04.17
උතුරු	2024.04.26
වයඹ	2024.05.11
සබරගමුව	2024.06.05
උතුරු මැද	2024.06.28

v. 2025 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම මඟින් වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව පළාත් සභා වෙත දැනුම් දීම.

2025 වසරේ මුල් මාස හතර සඳහා අතුරු සම්මත ගිණුමේ ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව පළාත් සභා වෙත දැනුම් දෙන ලදි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - රු. මි. 21,000, උපමාන පාදක ප්‍රදාන - රු. මි. 2,000 ක් සහ විදේශ ආධාර සහිත ව්‍යාපෘති - රු. මි. 2,000 ක් සහ ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ඇති ක්‍රියාකාරකම් නිම කිරීම සඳහා - රු. මි. 2,000, වාර්ෂික සංවර්ධන සැලසුම් සහ නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීම සඳහා 2025 වර්ෂයට විසර්ජන පනත් කෙටුම්පතෙන් පළාත් සභා නවය වෙත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙනුවෙන් රු.මි. 52,500 ක් සහ නඩත්තු කටයුතු සඳහා රු.මි. 25,000 ක් වෙන් කරනු ඇතැයි උපකල්පනය කරමින්, 2025 වර්ෂය සඳහා එක් එක් පළාතට වෙන් කිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව විසින් දැනුම් දෙන ලදි.

vi. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ - 2025

2025 වර්ෂය සඳහා වන පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ අදාළ ආකෘති සමග 2024 දෙසැම්බර් 29 වන දින සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යවන ලදි. 2025 වර්ෂය සඳහා පළාත් සභා වෙත වෙන් කරන ලද අරමුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය වන ආකාරයට වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ උපයෝගී වේ. ජාතික ප්‍රතිපත්ති රාමුව සහ පළාත් සංවර්ධන ප්‍රමුඛතා මත පදනම්ව පළාත් සභා විසින් සකස් කර ඇති මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්වලට අනුකූලව පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කර ඇත.

vii. නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම - 2025 සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ

2025 වර්ෂය සඳහා වන නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කර 2024 දෙසැම්බර් 31 වන දින සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යවන ලදි. පළාත් සංවර්ධනය හා බැඳුණු මහජනතාවට සෘජු ප්‍රතිලාභ ලැබෙන නඩත්තු කටයුතු සඳහා මෙම ප්‍රතිපාදන යෙදවීමට නියමිතය.

2.1.2. පළාත් පුනරාවර්තන අයවැයට අදාළ කරුණු

i. 2025 වසර සඳහා පුනරාවර්තන අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම

2025 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 2024 පෙබරවාරි 12 වන දින පළාත් සභා වෙත නිකුත් කිරීමත් සමග පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ විය. මෙම මාර්ගෝපදේශ, ප්‍රධාන වශයෙන් පුද්ගල පඩිනඩි, අනෙකුත් පුනරාවර්තන වියදම්, පළාත් පාලන ආයතනවලට මාරු කිරීම් සහ පළාත් ආදායම් ඇස්තමේන්තු යනාදී කරුණු මත පදනම් වේ. මාර්ගෝපදේශ සමග ප්‍රදාන සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කිරීමේදී පළාත් සභා විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍ර කට්ටලයක් ද ලබා දෙන ලදි.

ii. 2025 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම

පළාත් සභා විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද තම පුනරාවර්තන අවශ්‍යතා ඇතුළත් ආකෘති පත්‍ර, මාර්ගෝපදේශය සමග අමුණා ඇති දින දර්ශනයට අනුව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, 2025 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳව පළාත් බලධාරීන් සමග සාකච්ඡා කර තක්සේරු කරන ලදී. මේ සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, අයවැය අධ්‍යක්ෂවරුන් ඇතුළු අනෙකුත් අදාළ පළාත් නිලධාරීන් සමග රැස්වීම් කිහිපයක් පැවැත් වූ අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් ද ඊට සහභාගී වූහ.

පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වාර්ෂික අයවැය සාකච්ඡා කාලසටහන පහත දැක්වේ.

වගුව 04: වාර්ෂික අයවැය සාකච්ඡා පවත්වනු ලැබූ කාලසටහන

පළාත	සාකච්ඡා පැවැත්වූ දිනයන්
මධ්‍යම	2024.06.13
බස්නාහිර	2024.06.14
දකුණු	2024.06.18
වයඹ	2024.06.19
උතුරු මැද	2024.06.20
උතුරු	2024.06.24
සබරගමුව	2024.06.25
නැගෙනහිර	2024.06.26
ඌව	2024.06.27

iii. පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳ නිර්දේශ මහා භාණ්ඩාගාරයට දැනුම් දීම

පළාත් බලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කර එම අගයන් 2025 ජාතික අයවැය සකස් කිරීමේදී සලකා බැලීම සඳහා මහා භාණ්ඩාගාරයට යොමු කරන ලදි. පළාත් සහා සඳහා නිර්දේශිත රු.මි. 578,084 ක සාමූහික ප්‍රදානය 2024.08.27 දින භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදි. (ආදායම් මාරු කිරීම, අවිනිශ්චිත අවස්ථා අරමුදල සහ අත්තිකාරම් "බී" ගිණුම සඳහා ඉල්ලීම් ඇතුළුව).

iv. 2025 වසරේ මුල් මාස හතර සඳහා පළාත්වලට වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් දැනුම් දීම

2025 වර්ෂයේ පළමු මාස හතර සඳහා වූ අතුරු සම්මත ගිණුමේ අනුමැතියට අනුව රජයේ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් 2024.12.21 දින පුනරාවර්තන අයවැයෙහි පළාත් සහා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් පළාත් සහා වෙත දැනුම් දෙන ලදි. අතුරු සම්මත ගිණුම යටතේ 2025 වසරේ පළමු මාස හතර සඳහා වෙන් කරන ලද මුළු පුනරාවර්තන ප්‍රතිපාදනය රු.මි. 157,696 කි.

v. 2024 වර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන නිර්දේශ කිරීම

පළාත් සහා විසින් අතිරේක ප්‍රතිපාදන සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලද්දේ ප්‍රධාන වශයෙන් දීමනා සංශෝධනය කිරීම, නව දීමනා හඳුන්වාදීම, අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව රේඛීය අමාත්‍යාංශ මගින් කළ කාර්යමණ්ඩල අනුයුක්ත කිරීම් සහ නව බඳවා ගැනීම් හේතුවෙනි. 2024 වසරේ දී නිර්දේශිත අතිරේක ප්‍රතිපාදන පහත පරිදි වේ;

වගුව **05: නිර්දේශිත අතිරේක ප්‍රතිපාදන – 2024**

(රු.'000)

දිනය	රේඛීය අමාත්‍යාංශ අනුයුක්ත කිරීම් සඳහා අතිරේක ප්‍රතිපාදන නිර්දේශය	අතිරේක ප්‍රතිපාදන සඳහා නව නිර්දේශ කිරීම්	අතිරේක ප්‍රතිපාදන සඳහා මුළු නිර්දේශ කිරීම්
2024.06.24	531,094	47,396,149	47,927,243
2024.10.11	90,114	917,846	1,007,960
මුළු එකතුව	**621,208**	**48,313,995**	**48,935,203**

vi. 2025 වසර සඳහා පළාත් ආදායම් තක්සේරුව

2024 පෙබරවාරි 12 වන දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පුනරාවර්තන අයවැය මාර්ගෝපදේශයට අනුව, පළාත් සභා ඔවුන්ගේ ඇස්තමේන්තුගත ආදායම් ඉලක්ක ඉදිරිපත් කළ අතර, ඒවා මුදල් කොමිෂන් සභාව විසින් විශ්ලේෂණය කර තක්සේරු කරන ලදී.

එකඟ වූ පළාත් ආදායම් ඉලක්ක සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කරන ලද රජයේ ආදායම් මාරු කිරීම් මත පදනම්ව මුදල් කොමිෂන් සභාව විසින් 2025 වර්ෂය සඳහා පළාත් ආදායම තක්සේරු කරන ලදී. 2025 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම වෙනුවෙන් අදාළ පළාත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 04 වන වගුවේ සඳහන් පරිදි පැවති රැස්වීම්වලදී, පළාත් ආදායම් ඉලක්ක මුදල් කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදි.

vii. පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පළාත් සභා වෙත අක්මුදල් නිදහස් කිරීම් නිර්දේශ කිරීම

2023.12.29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2023 ප්‍රකාරව පළාත් සභා විශේෂ වියදම් ඒකක ලෙස නම් කර ඇති බැවින්, අයවැය ක්‍රියාකාරකම් සහ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරුන් විසින් පාර්ලිමේන්තුවට සෘජුව වගකිව යුතු වේ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති අංක TO/BE4/01/07/06 දරන 2024/03/06 දිනැති ලිපියට අනුව, 2024 වර්ෂය සඳහා පළාත් සභාවලට අවශ්‍ය පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ අක්මුදල් නිදහස් කිරීම් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

2.1.3 ඇතැම් තීරණාත්මක කරුණු සම්බන්ධයෙන් පළාත් සැලසුම් අංශය විසින් පවත්වන ලද විශේෂ රැස්වීම්

* 2024 පෙබරවාරි 15 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නියෝජිතයන් සමග පළාත් පාලන ආදායම් මූලාශ්‍ර පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදි.

* විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ ලබා දෙන ලද ප්‍රතිපාදන සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සම්බන්ධයෙන් පළාත් සභා නවයේම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සමග මුදල් කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් Zoom තාක්ෂණය හරහා 2024 මාර්තු 06 වැනි දින රැස්වීමක් පැවැත්විණි.

* පළාත් සභා සේවකයින්ගේ පුද්ගල පඩිනඩි තක්සේරු කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය අධ්‍යයනය කිරීම සඳහා ලෝක බැංකු නියෝජිතයින් 2024 ජූනි 26 දින මුදල් කොමිෂන් සභාව

වෙත පැමිණියහ. මෙම සාකච්ඡාවට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද සහභාගී විය.

* මධ්‍යම රජයේ සහ පළාත් පාලන ආයතනවල දේපල බදු ආදායමේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡාවක් 2024 ජූනි 28 වන දින ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

* විමධ්‍යගත විෂයයන්ට අදාළව විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, එම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024 අගෝස්තු 12 වන දින මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ අදාළ නිලධාරීන් විසින් පැවැත්විණි.

* පරිවාස හා ළමාරක්ෂක අංශයේ තීරණාත්මක ගැටළු කිහිපයක් සාකච්ඡා කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල කොමසාරිස්වරුන් සමග රැස්වීමක්, මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් හා අදාළ නිලධාරීන් එක්ව 2024 නොවැම්බර් 22 වැනි දින මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදි.

* මධ්‍යම පළාත් විශේෂ සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදනවලට අදාළ ව්‍යාපෘති නිරීක්ෂණය කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර චාරිකාවක් 2024 අගෝස්තු මස 16 වන දින පවත්වන ලදි.

* හොරණ මූලික රෝහල දිස්ත්‍රික් රෝහලක් දක්වා උසස් කිරීමත් සමග අවශ්‍ය අතිරේක කාර්ය මණ්ඩල අවශ්‍යතා තක්සේරු කිරීම පිණිස ක්ෂේත්‍ර චාරිකාවක් මුදල් කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024 සැප්තැම්බර් 13 වන දින සිදු කරන ලදි.

2.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2023 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 02/2020 ට අනුකූලව සකසන ලද මුදල් කොමිෂන් සභාවේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම පිණිස 2024 මැයි 28 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව එම වාර්තාව 2024 ජූනි 18 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මුදල් කොමිෂන් සභාව පිළිබඳ මූලික හැඳින්වීම, 2023 වර්ෂයට අදාළව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන්වල කාර්යසාධනය, මූල්‍ය ප්‍රගතිය සහ අනුකූලතා වාර්තාව මෙම වාර්තාවෙහි අන්තර්ගත මූලික කරුණු වේ. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුව මෙම වාර්තාව සකස් කරන ලදි.

2.1.5 ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශවලට අදාළ කරුණු

i. 2025 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික නිර්දේශ සකස් කර ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

මුදල් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) වගන්තියට අනුකූලව, 2025 වර්ෂය සඳහා වාර්ෂික නිර්දේශ සකස් කර 2024 දෙසැම්බර් 30 වන දින ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින්, 2025 වර්ෂය වෙනුවෙන් පළාත් සභා සඳහා තක්සේරු කරන ලද අරමුදල් අවශ්‍යතාවලට අදාළ නිර්දේශ සහ වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් පළාත් සභා අතර බෙදා හැරීම පිළිබඳ මූලධර්ම මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇත.

ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) වගන්තියට අනුව, 2025 වර්ෂය සඳහා ජාතික අයවැයෙන් පළාත් සභාවල ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා සඳහා වෙන් කළ යුතු අරමුදල් සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් සිය නිර්දේශ රජයට ඉදිරිපත් කරන ලදි. පුරෝකථනය කරන ලද ආදායම ගැලපීමෙන් පසු, 2025 වසර සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස රු.මි. 133,681 ක් සහ උපමාන පාදක ප්‍රදාන ලෙස රු. මි. 18,000 ක් නිර්දේශ කරන ලදි. ඒ අනුව, පුරෝකථනය කරන ලද ආදායම් ඉලක්ක ගැලපීමෙන් පසු, 2025 වර්ෂය සඳහා පළාත් සභා වෙනුවෙන් නිර්දේශිත මුළු ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය රු.මි. 151,681 කි. මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් හැර ආදායම් ඉලක්ක ගැලපීමෙන් පසු, පුනරාවර්තන අවශ්‍යතාවය ලෙස නිර්දේශිත සාමූහික ප්‍රදානය රු. මි. 578,084.02 ක් විය. මේ අනුව, ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදානවල මුළු වටිනාකම රු.මි. 729,765.02 ක් විය.

ඒ සමගම රජයේ සමස්ත සංවර්ධන උපාය මාර්ගයට අනුපූරක වන සහ පළාත් සභාවල ඵලදායී කාර්යසාධනය සඳහා පහසුකම් සැලසිය හැකි ඇතැම් ප්‍රතිපත්ති නිර්දේශ ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

ඒ අනුව, 2025 වර්ෂය සඳහා ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ කෙටියෙන් පහත විස්තර කෙරේ.

(1) පළාත් සභා විසින් මෙන්ම ජාතික මට්ටමේ ආයතන විසින්ද ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වඩාත් අර්ථාන්විත පරිදි සම්පත් වෙන් කිරීම පිණිස යෝග්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම

ප්‍රධාන සමාජ-ආර්ථික සාධක සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද විද්‍යාත්මක සූත්‍රයක් භාවිතා කරමින් විමධ්‍යගත විෂයන්ට අදාළව එක් එක් පළාත සඳහා මුදල් කොමිෂන් සභාව විසින් අරමුදල් නිර්දේශ කරනු ලැබුවද, සමස්ත අයවැය ප්‍රතිපාදනයෙන් වැඩි කොටසක් වියදම් කරනු ලබන රේඛීය අමාත්‍යාංශ, ඒවායෙහි අදාළ විෂයයන් සඳහා තාර්කික අරමුදල් වෙන් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකරයි. එබැවින්, ප්‍රදේශ අතර සම්පත් සාධාරණව වෙන් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ විසින් එවැනි විද්‍යාත්මක ක්‍රමවේදයක්/සූත්‍රයක් භාවිතා නොකරන තත්ත්වයක් තුළ, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීම යථාර්ථවාදී නොවිය හැකිය. එබැවින්, රේඛීය අමාත්‍යාංශ විසින් ද විවිධ ප්‍රදේශ සඳහා අරමුදල් වෙන් කිරීමේ දී මුදල් කොමිෂන් සභාව විසින් භාවිතා කරන සූත්‍රයට සමාන (මෙම සූත්‍රයම වීම අත්‍යාවශ්‍ය නැත) සූත්‍රයක් භාවිතා කළ හැකි නම් එය වඩාත් යෝග්‍ය බව කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

(2) ජාතික හා පළාත් මට්ටමින් පොදු සහ ඒකාබද්ධ සැලසුම් යාන්ත්‍රණයකට අනුගත වීමේ අවශ්‍යතාවය

පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී ද්විකරණය වීම වළක්වා ගැනීම සඳහා සමාන විෂයයන් යටතේ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන විසින් එක් එක් පළාත තුළ සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් නිසි පරිදි හඳුනා ගනු ලැබේ. කෙසේ වෙතත්, රේඛීය අමාත්‍යාංශ තම

සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එවැනි පිළිවෙතක් අනුගමනය නොකරන බැවින්, විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් ද්විකරණය වීම හේතුවෙන් සම්පත් අපතේයාම් නැවත නැවතත් සිදු වීම දක්නට ලැබේ. එබැවින්, ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කරමින් පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රණයට සමාන පොදු සහ ඒකාබද්ධ සැලසුම්කරණ ප්‍රවේශයක් රේඛීය අමාත්‍යාංශ විසින්ද භාවිතා කිරීම මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

(3) පළාත් සභාවලට ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදානයන් ප්‍රමාණවත් නොවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ විමධ්‍යගත ලැයිස්තුව යටතේ පළාත් සභාවලට පුළුල් විෂයයන් ලැයිස්තුවක් පවරා ඇතත්, රජයේ මුළු ප්‍රාග්ධන වියදමෙන් 15% ක් පමණ මුදලක් පළාත් සභා හරහා සිදු කරන අතර, වැඩි කොටස රේඛීය අමාත්‍යාංශ හරහා වෙන් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික හා මානව සම්පත් පළාත් සභා සතුව තිබියදීත්, එම විමධ්‍යගත විෂයයන් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් පළාත් සභා පීඩා විඳිති. එබැවින්, විමධ්‍යගත විෂයයන් සඳහා වෙන් කරන අරමුදල් කිසිදු අමතර වියදමකින් තොරව පළාත් සභාවලට යොමු කිරීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කළ අතර, මෙම කාරණය සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස කොමිෂන් සභාව ඉල්ලා ඇත.

(4) විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘතීන්හී ක්‍රියාකාරකම් පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්මට සම්පූර්ණයෙන්ම ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය

බොහෝ විට විමධ්‍යගත විෂයයන් යටතේ ඇති සංවර්ධන කටයුතු, පළාත් මට්ටමේ පවතින යාන්ත්‍රණය සහ සම්පත් භාවිතා නොකර නව ව්‍යාපෘති කාර්යාල සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් සඳහා ඉහළ වියදම් දරමින් විවිධ විදේශ අරමුදල් ප්‍රභවයන් හරහා රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. එබැවින්, විදේශාධාර මගින් අරමුදල් සපයනු ලබන එවැනි සංවර්ධන කටයුතු ද්විකරණය සහ සම්පත් නාස්තිය වළක්වා ගනිමින් සාපේක්ෂව අඩු පිරිවැයකින් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සංවර්ධන සැලසුම් සමඟ ඒකාබද්ධ කිරීමට ද මුදල් කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

(5) ප්‍රසම්පාදන ක්‍රියාවලිය මග හැර ප්‍රජා මූල සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් ලබාදීමේ වත්මන් ක්‍රමවේදය පිළිබඳව නැවත සලකා බැලීමේ අවශ්‍යතාවය

කුඩා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල සෘජු කොන්ත්‍රාත්තු ග්‍රාමීය සංවර්ධන සමිතිවලට ලබා දීම ආරම්භ කරන ලද්දේ ග්‍රාමීය ප්‍රජාවේ ශ්‍රම දායකත්වය සහ අධීක්ෂණය හරහා ඇස්තමේන්තුගත පිරිවැයට සාපේක්ෂව එවැනි ව්‍යාපෘතිවල නිර්මාණය කරන ලද වත්කම්වලට අගය එකතු කිරීමේ අරමුණෙනි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් සීමාව රු. මිලියන 2 සිට රු. මිලියන 5 දක්වා වැඩි කිරීම, එවැනි කොන්ත්‍රාත්තු සමඟ සම්බන්ධ වීමට සුදුසුකම් ලත් සංවිධාන සංඛ්‍යාව 8 සිට 13 දක්වා වැඩි කිරීම සහ ප්‍රාදේශීය දේශපාලනඥයින්ගේ සෘජු මැදිහත්වීම හේතුවෙන් ව්‍යාපෘති වෙන් කිරීමේ ප්‍රවණතාවයක් මතු වූ අතර එමගින් ක්‍රියාවලිය ලාභ අරමුණු කරගත් ව්‍යාපාරික ස්වභාවයක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස දුර්වල ගුණාත්මක නිමැවුම් සහ මහජන අරමුදල් නාස්තිය සිදු විය. එබැවින්, කුඩා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ග්‍රාමීය සංවර්ධන සමිති වෙත ප්‍රදානය කිරීමේ මෙම පිළිවෙත නැවත සලකා බැලීම සුදුසු බව මුදල් කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

(6) පළාත් කාර්යමණ්ඩලය වඩාත් අර්ථාන්විත පදනමක් යටතේ සේවයේ යෙදවීම

පළාත් මට්ටමේ බොහෝ ආයතනවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් රාජ්‍ය සේවා සැපයීම බරපතල ලෙස අඩාල වී ඇති අතර, තවත් සමහර ආයතනවල අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටින බව දක්නට ලැබේ. එබැවින්, එම ආයතනවල පුරප්පාඩු පිරවීම සඳහා අතිරික්ත කාර්ය මණ්ඩල වඩාත් අර්ථාන්විත ලෙස යෙදවීමට මුදල් කොමිෂන් සභාව යෝජනා කර ඇත. රාජ්‍ය සේවයේ මෑත

කාලීන වර්ධනයන් සහ ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ඇතැම් සේවාවන් බාහිරින් ලබා ගැනීම, ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම සහ සේවා සැපයීමේ භූගෝලීය ස්ථාන තාර්කික පදනමක් යටතේ පිහිටුවීම හා නව තාක්ෂණය භාවිතා කිරීමට නියමිතව ඇති බැවින්, පුළුල් සේවක සංඛ්‍යා සමාලෝචනයක් සිදු කර රාජ්‍ය අංශයේ මිනිස් බල අවශ්‍යතාවය නැවත සලකා බැලීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කර ඇත.

(7) පළාත් පාලන ආයතනවල ආදායම් ඉපැයීම ඇතුළුව කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා එම ආයතනවල නීතිමය රාමුව ශක්තිමත් කිරීම

පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය සහ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා පළාත් පාලන ආයතනවල නීතිමය රාමුව ශක්තිමත් කිරීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කරන ලදි. ආදායම් ගැටළු විසඳීම, ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාපටිපාටි විධිමත් කිරීම, මධ්‍යම පරිසර අධිකාරිය වැනි ඇතැම් නියාමන අධිකාරීන් විසින් බලය පැවරීම පිළිබඳ පැහැදිලි අර්ථ දැක්වීම, ඵලදායී සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා නීති සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය දැඩි ලෙස හැඟුණු මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීමට මෙහිදී යෝජනා කර ඇත. උසාවි දඩ සහ මුද්දර ගාස්තු පළාත් සභා හරහා යොමු නොකර පළාත් පාලන ආයතන වෙත සෘජුවම ප්‍රේෂණය කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කරමින් ඉහත සඳහන් පළාත් පාලන ආයතනවලට අදාළ නීති සම්පාදනය කිරීම පිණිස වසර කිහිපයකට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවය මුදල් කොමිෂන් සභාව විසින් අවධාරණය කරන ලදි. තවද, ජලභීතිකා රෝගය පාලනය කිරීම සහ සුනඛයින් ලියාපදිංචි කිරීම සම්බන්ධ නීති සංශෝධනය කිරීම, පළාත් පාලන ආයතනවල සාමාජිකයින් සංඛ්‍යාව සමාලෝචනය කිරීම ද නිර්දේශවල යෝජනා කර ඇත.

(8) ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් නොමැති පළාත් පාසල්

සුදුසුකම්ලත් සහ පළපුරුදු ගුරුවරුන් ලබා ගැනීමේ දී පළාත් පාසල් සහ ජාතික පාසල් අතර බරපතල විෂමතාවයක් පවතින බව නිරීක්ෂණය වී ඇත. අවශ්‍ය වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ගුරුවරුන් ජාතික පාසල්වල සංකේන්ද්‍රණය වී සිටින අතර, පළාත් පාසල් සඳහා එවැනි ගුරුවරුන්ගේ විශාල හිඟයක් පවතී. විශේෂයෙන් විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් මෙන්ම උසස් පෙළ විෂයයන් සඳහා ද මෙම ගැටළුව ඉතා තීරණාත්මක වී ඇති අතර, ඒ සඳහා පළාත් පාසල් විසින් යොදන තාවකාලික විසඳුම් ද ඵලදායක නොවේ. ජාතික මට්ටමේ සිටින අතිරික්ත ගුරුවරුන් පළාත් මට්ටමට මාරු කිරීම ඉහත ගැටළු සඳහා විසඳුම වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලැයිස්තුව සහ සංවෘත ලැයිස්තුව අතර අධ්‍යාපන විෂය වෙන් කිරීමත් සමඟ එවැනි මාරු කිරීමේ ක්‍රියාවලිය අතිශයින් දුෂ්කර වී ඇත.

එබැවින්, කොමිෂන් සභාව පහත යෝජනා නිර්දේශ කර ඇත;

(අ) ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ගුරුවරුන් තුලනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ඇතැම් කොන්දේසි සහ ක්‍රියාපටිපාටිවලට යටත්ව ජාතික පාසල්වලින් පළාත් පාසල්වලට ගුරුවරුන් මාරු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම බලය පළාත් මට්ටමට පැවරීම.

(ඇ) ඉහත ගැටලුවට වඩාත් ශක්‍ය විසඳුම් නිර්දේශ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජනය සමඟ අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවීම.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලැයිස්තුවේ III වන පරිශිෂ්ටයේ 9 වන අයිතමයේ විධිවිධාන අනුව පළාත් අධ්‍යාපන මණ්ඩල පත් කිරීම.

(9) අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල් ප්‍රතිසංවිධානය තුළින් ග්‍රාමීය ප්‍රදේශවල හා වතුකර ප්‍රදේශවල අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය

ග්‍රාමීය හා වතුකර ප්‍රදේශවල අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල්වල දරුවන්ට වඩා හොඳ අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයිය යුතු බව නිරීක්ෂණය වී තිබේ. 2022 වර්ෂයේදී සිසුන් 50 ට අඩු පාසල් 1402 ක් හඳුනාගෙන ඇති අතර, කොළඹ නගරබද ප්‍රදේශවල පවා එවැනි පාසල් තිබෙන බව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ඇතැම්විට එම පාසල්වල සිසුන් සංඛ්‍යාවට වඩා ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින බැවින්, විශාල සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල් හා සසඳන විට එක් සිසුවෙකු සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුව ඇති අතර, එවැනි පාසල්වල ඉගෙනුම් පරිසරය දුර්වල තත්ත්වයේ පවතී. එම පාසල්වලින් බහුතරයක්, සිසුන් විශාල සංඛ්‍යාවක් සිටින සහ වැඩි පහසුකම් ඇති අවට පාසල් සමඟ ඒකාබද්ධ කළ හැකි නම් වඩා හොඳ ඉගෙනුම් අවස්ථා සඳහා වැඩි පහසුකම් ලබා ගත හැකිය. එමගින් අනෙකුත් ග්‍රාමීය පාසල්වල පුරප්පාඩු සඳහා ගුරුවරුන් 7,000 ක් පමණ මුදා හැරීමට හැකි වේ. එබැවින්, පිරිවැය අවම කර ගනිමින් සහ ගුරුවරුන් තාර්කිකව යෙදවීම තුළින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා, සිසුන් අඩු සංඛ්‍යාවක් සිටින පාසල් ප්‍රතිසංවිධානය කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට මුදල් කොමිෂන් සභාව යෝජනා කර ඇත.

(10) ආයතනගත ළමුන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනා

මෙම නිර්දේශයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු සහ විවිධ රාජ්‍ය නොවන සංවිධාන මගින් කළමනාකරණය කරනු ලබන ආයතනවල රැකවරණය ලබන දරුවන් මෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් විවිධ රැඳවුම් නිවාසවල සිටින පිරිමින් සහ කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කර ඇත. සමාජ සේවා සහ පරිවාස හා ළමාරක්ෂක යන අංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විමධ්‍යගත විෂයයන් වුවත් පළාත් සභා වෙත වෙන් කෙරෙන අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින්, මෙම විෂයයන් සඳහාද වෙන් කෙරෙන අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් භෞතික හා මානව සම්පත් ඌණතාවයක් පැවතීම එම ආයතනවල දුර්වල සේවා සැපයීමට හේතු වී ඇත.

මෙම පසුබිම තුළ, ආයතනගත වූ දරුවන්ට වඩා හොඳ අනාගතයක් සහතික කිරීම සඳහා රජයේ ඍජු මැදිහත්වීමේ වැදගත්කම මුදල් කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇති අතර, ඒ සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කර ඇත;

i. 1939 අංක 48 දරන ළමයින් සහ තරුණයින් පිළිබඳ වූ ආඥාපනත, 1941 අංක 24 දරන දරුවන් දරුකමට හදාවඩා ගැනීමේ ආඥාපනත, 1998 අංක 50 දරන ජාතික ළමාරක්ෂක අධිකාරී පනත, 1978 අංක 02 දරන පනතින් සංශෝධිත 1841 අංක 04 දරන අයාල ආඥාපනත, 1907 අංක 05 දරන නිවර්තන නිවාස ආඥාපනත වැනි මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ නීති සංශෝධනය කිරීම හෝ ඒකාබද්ධ කිරීම.

ii. ආයතනගත දරුවන්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා ඉහත සඳහන් ආයතනවලට වඩා පළපුරුදු වෘත්තීය පාලිකාවන් හා සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හැකි වන පරිදි, නව බඳවා ගැනීම් සහ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් වන රජයේ ප්‍රතිපත්තිය ලිහිල් කිරීම.

iii. අවම අත්‍යවශ්‍ය පහසුකම් පවා නොමැතිව දැනට ක්‍රියාත්මක වන ආයතන සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා විශේෂ අයවැය ප්‍රතිපාදන ලබා දීම. අවශ්‍ය පහසුකම් සහිතව පළාත් දෙකක් හෝ වැඩි ගණනක් සඳහා එක් සහතික කළ පාසලක් පිහිටුවීම සඳහා අරමුදල් වෙන් කිරීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇතැයි එහිදී යෝජනා විය.

iv. උසාවි වෙත ළමුන් සහ තරුණයින් ප්‍රවාහනය කිරීම හා පළාත තුළ සහ පළාත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා අවම වශයෙන් පළාතකට එක් වාහනයක් බැගින් හෝ සැපයීම.

v. සමාජයේ අනෙකුත් දරුවන්ට සමානව ආයතනගත දරුවන්ටද ගුණාත්මක වෘත්තීය පුහුණුවක් ලබා දීම සඳහා වෘත්තීය පුහුණුව සඳහා වගකිව යුතු ජාතික මට්ටමේ ආයතනවලට උපදෙස් දීම.

vi. සමාජීය වශයෙන් දුරාචාරමය සිදුවීම්වලදී අපයෝජනයට ලක්වීම හෝ විඳින්දිතභාවයට පත්වීම වළක්වා ගැනීම සඳහා, වයස අවුරුදු 18 සම්පූර්ණ කරන දරුවන්ට තම පවුල් සමග නැවත එක්වීමට හෝ සමාජය සමග ඒකාබද්ධ වීමට නොහැකි නම්, යම් යම් කොන්දේසිවලට යටත්ව අදාළ ආයතනවල රැඳී සිටීමට හැකි වන පරිදි නීති සංශෝධනය කිරීම.

vii. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දැනට අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබා දෙන නිවාස පහසුකම් සැපයීමේදී සමාජය සමග නැවත සමාජගත වීමට හැකි වන ළමුන්ට ප්‍රමුඛතාවය ලබා දීම.

viii. ඔටිසම් හා වෙනත් මානසික වර්ධන ඌනතාවලින් පෙළෙන ළමුන් සඳහා පළාතකට එකක් බැගින් හෝ එසේත් නැතිනම් යටත් පිරිසෙයින් පළාත් කීපයකට එක් මධ්‍යස්ථානයක් බැගින් හෝ සහතික කළ පාසල් වැනි මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අරමුදල් සැපයීම.

(11) අඩු ආදායම් ලබන පවුල්වල පෝෂණ ඌණතාවයෙන් පෙළෙන ළමුන්

රජය විසින් වයස අවුරුදු 3 ත් 5 ත් අතර දරුවන්ට ත්‍රිපෝෂ ලබා දීමෙන් සහ ලියාපදිංචි පෙර පාසල්වලට සපයනු ලබන ආහාර මගින් ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා යම් යම් උත්සාහයන් ගෙන ඇතත්, තවමත් මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන්ගේ ඇතැම් කාණ්ඩ තිබේ. උදාහරණයක් ලෙස, (අ) වයස අවුරුදු 3 ට අඩු දරුවන්ට ත්‍රිපෝෂ හෝ පෙර පාසල් ආහාර නොලැබේ (ඔවුන් පෙර පාසල් නොයති); (ආ) පෙර පාසල් නොයන වයස අවුරුදු 3 ත් 5 ත් අතර දරුවන්; (ඇ) ලියාපදිංචි නොකළ පෙර පාසල්වලට යන වයස අවුරුදු 3 ත් 5 අතර දරුවන්; (ඈ) ඉහත කාණ්ඩවලට අයත් වතුකරයේ දරුවන්.

එබැවින්, එම කාණ්ඩවල ළමුන්ගේ මන්දපෝෂණ ගැටළුව විසඳීම සඳහා මුදල් කොමිෂන් සභාව පහත සඳහන් නිර්දේශ යෝජනා කර ඇත;

(අ) ඇෆ්ලටොක්සින් (Aflatoxin) ඇතැයි සැක කෙරෙන ධාන්‍ය වර්ගය එනම් බඩ ඉරිඟු වෙනුවට සහල් සහ වෙනත් පෝෂණීය ධාන්‍ය මිශ්‍ර කරමින් ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීමේ ත්‍රිපෝෂ සමාගමේ වැඩපිළිවෙළ දිරිමත් කිරීම හා එම ආයතනය විසින් නිපදවනු ලබන “සුපෝෂ” පහසු මිලකට ලබාදීමේ හැකියාව සොයා බැලීම.

(ආ) පෝෂ්‍යදායී ධාන්‍ය මිශ්‍රණයක් අඩංගු “Sathumavu” ලෙස හඳුන්වන ඇතැම් ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද පෝෂණ මැදිහත්වීම රටේ අනෙකුත් ප්‍රදේශවලට ප්‍රචලිත කිරීමේ ශක්‍යතාව ගවේෂණය කිරීම.

(ඇ) සාධාරණ මිලකට බිත්තර ලබා ගැනීමට පහසුකම් සැලසීම.

(ඈ) වතු වැවිලි ප්‍රදේශවල සේවය කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සහ මහජන පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සේවය, වතුකරයේ සේවය කරන මව්වරුන්ට පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි නම්‍යශීලී රාජකාරී වේලාවන් හඳුන්වා දීම.

(ඉ) රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව වැවිලි සමාගම් විසින් පවත්වාගෙන යනු ලබන වතුකර ප්‍රදේශවල රෝහල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන රජයට පවරා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම

සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් සෞඛ්‍ය බලධාරීන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවීම.

(ඊ) පෙර පාසල් අධ්‍යාපනය සහ පූර්ව ළමාවිය සංවර්ධනය පළාත් සභා වෙත බලය පැවරී ඇති විෂයයන් බැවින්, පෙර පාසල් ආහාර වැඩසටහන, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීමේ වත්මන් යාන්ත්‍රණය වෙනුවට, එම වැඩසටහන පළාත් සභා හරහා ක්‍රියාත්මක කිරීමට හෝ පළාත් බලධාරීන් සමඟ සමීපව සම්බන්ධීකරණය කිරීමට යෝජනා කෙරේ.

ii. 2025 වර්ෂය සඳහා වන නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ - 2025 සම්බන්ධයෙන් කැබිනට් සංදේශයක් 2025 ජනවාරි 23 වන දින ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර, එමගින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටියේය. ඒ අනුව, නිර්දේශ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය 2025 ජනවාරි 27 වන දින ලබා දෙන ලද අතර, එය සභාගත කිරීම සඳහා 2025 පෙබරවාරි 07 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

2.1.6 කාර්තුමය විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

2024 වර්ෂයේ 2024.12.31 දින දක්වා අභ්‍යන්තර විගණන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

1. මුදල් රෙගුලාසි 134(2) ට අනුව 2024 වර්ෂය සඳහා සකසන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අනුමත කර 2024.03.28 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

2. කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/1 – 2019 අනුව මූලික වාර්තාව සකස් කර 2024 ජනවාරි මාසය තුළ කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

3. සියලුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු ලබා ගෙන ඇත.

4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තියට අනුකූලව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

5. මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.

6. 2024 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදීම ඇගයීම් වාර්තා විගණකාධිපතිවරයාට සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

7. 2024 වර්ෂයේ සෑම කාර්තුවකටම අදාළව අභ්‍යන්තර විගණන රැස්වීම් පහත සඳහන් දිනවල පවත්වන ලදී;

පළමු කාර්තුව	2024.03.28
දෙවන කාර්තුව	2024.06.27
තුන්වන කාර්තුව	2024.09.30
හතරවන කාර්තුව	2024.12.27

2.2 මුදල් කොමිෂන් සභාව ළඟාකර ගත් සාර්ථකත්වයන්

(i) ප්‍රධාන ලේකම්වරුන් එක් එක් පළාත සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස පත් කිරීම.

1987 වර්ෂයේ දී පළාත් සභා පිහිටුවීමේ ආරම්භයේ සිටම පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා, එක් එක් පළාතට වෙන් කරන ලද රජයේ අරමුදල් සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස සලකනු ලැබීය. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ බලතල සහ කාර්යයන් බෙදා හැරීමට අනුව, එක් එක් පළාතේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා අදාළ පළාතේ ප්‍රධාන ලේකම් විය යුතු බව මුදල් කොමිෂන් සභාව බොහෝ අවස්ථාවන්හිදී අවධාරණය කළේය. මෙය රජය සහ භාණ්ඩාගාරය විසින් මනාව පිළිගත් අතර, එක් එක් පළාතේ ප්‍රධාන ලේකම්වරයා අදාළ පළාත සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස පත් කරන බවට ලිපියක් නිකුත් කරන ලදි.

(ii) 2025 වාර්ෂික අයවැයෙන් මුදල් කොමිෂන් සභා නිර්දේශ සඳහා ඉහළ අවධානයක් ලැබීම.

පළාත් සභාවල අරමුදල් අවශ්‍යතා සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ නිර්දේශ සඳහා 2025 වසරේ රජයේ වාර්ෂික අයවැයෙන් පෙර වසරවලට වඩා ඉහළ බර තැබීමක් ලබා දී ඇත.

තවද, පළාත් සංවර්ධනයට සෘජු බලපෑමක් ඇති කරන රජයේ සමස්ත සංවර්ධන උපාය මාර්ගය පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිමය නිර්දේශ සඳහා ඉහළ පිළිගැනීමක් ලබා දෙමින් එම නිර්දේශ, ගරු ජනාධිපතිතුමාගේ 2025 වසර සඳහා වන රජයේ වාර්ෂික අයවැය කතාවේ විශේෂ සඳහනක් කර ඇත.

එකී අයවැය කතාවේ සඳහන් ක්ෂේත්‍ර පහත දැක්වේ;

• ඔටිසම් හෝ වෙනත් මානසික ඌනතා ඇති දරුවන් සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම,

• අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින ග්‍රාමීය හා දුරස්ථ ප්‍රදේශවල පාසල් සැලකිල්ලට ගනිමින් පාසල් නැවත ස්ථානගත කිරීම සම්බන්ධයෙන් ජාතික සැලැස්මක් සකස් කිරීම සඳහා පාසල් පද්ධතිය සමාලෝචනය කිරීම,

• පරිවාස භාරයේ සිටින දරුවන්ගේ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා සහතික කළ පාසල්/රිමාන්ඩ් නිවාස සහ ළමාරක්ෂක ආයතන ප්‍රතිසංස්කරණය කිරීම,

• ළමා විඳීතයින් වූ ආයතනික දරුවන් උසාවි වෙත රැගෙන යාම සහ ඒමට ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.

• අනාථ දරුවන් සහ තරුණයින් සඳහා සමාජ ආරක්ෂාව වැඩි දියුණු කිරීම;

* අනාථ දරුවන්ට නිවාස පහසුකම් සැලසීම,
* ළඟම ඇති ජාතික හෝ පළාත් පාසල්වලින් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලබා දීම,
* NVQ 3 හෝ 4 මට්ටමේ ගුණාත්මක වෘත්තීය/කුසලතා පුහුණුව ලබා දීම,
* ආයතනික දරුවන් සමාජයට ඒකාබද්ධ වූ විට ඔවුන්ට නිවාස ආධාර සඳහා ප්‍රමුඛතාවය ලබා දීම,
* සමාජයට නැවත ඒකාබද්ධ වීමට සුදුසු ස්ථානයක් නොමැති වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පුද්ගලයින්ට ඇතැම් කොන්දේසි යටතේ ආයතනවල දිගටම රැඳී සිටීමට ඉඩ සැලසෙන පරිදි අදාළ නීති සංශෝධනය කිරීම.

(iii) මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලද අනුමැතිය සහ විශේෂ උපදෙස්

2025 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවලට අදාළව 2025.01.23 දිනැති අංක 25/0144/801/003 දරන කැබිනට් පත්‍රිකාවේ ගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණවලින් පෙනී යන්නේ, රටේ සමස්ත සංවර්ධන උපාය මාර්ගය තුළ මුදල් කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ හොඳින් සලකා බලනු ඇති බවයි. ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද එම නිරීක්ෂණ 2025.01.27 දිනැති අංක CP/25/0144/801/003 දරන කැබිනට් තීරණය මගින් අනුමත කර ඇත. ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිරීක්ෂණ කෙටියෙන් පහත පරිදි වේ;

* ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශ්වික ආයතන මගින් අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි පළාත් සභාවලට පවරා ඇති විෂයයන් සඳහා ලබා දෙන අරමුදල් මෙන්ම ද්විපාර්ශ්විකව ලබා දෙන අරමුදල් 2025 වසරේ සිට පළාත් සභාවලට ලබා දෙනු ඇත.

* විවිධ ප්‍රදේශවල සංවර්ධනය සඳහා අරමුදල් වෙන් කිරීමේදී රේඛීය අමාත්‍යාංශවල ද මුදල් කොමිෂන් සභාව විසින් භාවිතා කරන ලද සූත්‍රයට සමාන සූත්‍රයක් (අනිවාර්යයෙන්ම එම සූත්‍රයම වීම අවශ්‍ය නොවේ) භාවිතා කළ හැකි නම් එය වඩාත් යෝග්‍ය වනු ඇත.

* සංවර්ධන කටයුතු සඳහා පළාත් සභා විසින් දැනට අනුගමනය කරන යාන්ත්‍රණයට සමාන සැලසුම්කරණ යාන්ත්‍රණයක් අනුගමනය කරමින් සියලුම රාජ්‍ය ආයතන සඳහා ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සොයා බැලීම සුදුසු බව.

* බලය බෙදා හරින ලද විෂයයන් සඳහා රේඛීය අමාත්‍යාංශවලට අරමුදල් වෙන් නොකිරීමට මහා භාණ්ඩාගාරය අවශ්‍ය පියවර ගත යුතුය.

* විදේශ අරමුදල් සහිත ණය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගනු ලබන අතරම, එම කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ධාරිතාවක් පළාත් සභා සතුව ඇති බැවින් බලය පැවරුණු විෂයයන් සඳහා වන එවැනි ප්‍රදාන පළාත් සභා හරහා ක්‍රියාත්මක කළ යුතු වේ.

* ටෙන්ඩර් පටිපාටිය මඟ හරිමින් ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත්තු ලබා දීමේ වර්තමාන පිළිවෙත නැවත සලකා බැලීමේ යෝජනාව සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

* 2024.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, කාර්ය මණ්ඩල සමාලෝචනය සම්බන්ධයෙන් පත් කරන ලද නිලධාරීන්ගේ කමිටුවේ සලකා බැලීම සඳහා පළාත් කාර්ය මණ්ඩල තාර්කිකව යෙදවීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම.

* 2017 සහ 2021 වසරවල දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අදාළ පනත් කෙටුම්පත්වල අඩංගු සංශෝධන හැර, අවශ්‍ය යැයි හැඟෙන වෙනත් අවශ්‍ය කාලෝචිත සංශෝධන පිළිබඳව ගරු අමාත්‍යතුමා හරහා කැබිනට් මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කිරීම.

* උසාවි දඩ සහ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන වෙත සෘජුවම මාරු කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මුදල් කොමිෂන් සභා නිර්දේශයේ අඩංගු යෝජනාව සලකා බැලීම. තවද, ජලභීතිකා රෝගය පාලනය කිරීමේ වගකීම නිශ්චිත රජයේ ආයතනයකට පැවරීම සඳහා විධිවිධාන සැලසීම කෙරෙහි ප්‍රමුඛතාවය සලකා බැලීම.

* පළාත් පාසල් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් වෙන් කිරීම පිළිබඳ යෝජනාව නිසි ලෙස සලකා බලන ලෙස ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් (ගරු අධ්‍යාපන අමාත්‍යතුමියගෙන්) ඉල්ලා සිටීමට යෝජනා කිරීම.

* අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල් ප්‍රතිසංවිධානය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රදේශවල සහ වතුකරයේ අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා යොමු කිරීම.

* ආයතනික දරුවන්ගේ අභිවෘද්ධිය සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවල ප්‍රතිපත්ති නිර්දේශ අංක 10 යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදාළ බලධාරීන්ගේ නිසි අවධානය යොමු කිරීමට යෝජනා කිරීම. එහි දී, ප්‍රතිපත්ති නිර්දේශ අංක 10 (i) හි සඳහන් අදාළ නීති සංශෝධනය කිරීමේ යෝජනාව පිළිබඳව අදාළ අමාත්‍යවරුන් හරහා අමාත්‍ය මණ්ඩලයට ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට නියෝග කිරීමට යෝජනා කිරීම.

  තවද, ප්‍රතිපත්ති නිර්දේශ අංක 10 හි නිර්දේශ (ii) සහ (iv) සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමට අදාළ බලධාරීන්ට උපදෙස් දීමට යෝජනා කිරීම. එනම්, අදාළ ආයතනවලට අවශ්‍ය පළපුරුදු සහ වෘත්තීය කාර්ය මණ්ඩල අනුමැතිය/පුරප්පාඩු පිරවීම සහ ආයතනගත දරුවන්ගේ ප්‍රවාහනය සඳහා වාහන/ප්‍රවාහන පහසුකම් සැපයීම.

* මුදල් කොමිෂන් සභා නිර්දේශවල 11 වන ප්‍රතිපත්ති නිර්දේශයේ දක්වා ඇති යෝජනා, අනෙකුත් අදාළ අමාත්‍යාංශවල සහභාගීත්වයෙන් සුදුසු ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව නිරීක්ෂණය කරන ලෙස ගරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් සහ ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීම.

2.3 අභියෝග සහ අනාගත දැක්ම

පසුගිය වසර කිහිපය තුළ අත්විඳින ලද දරුණුතම ආර්ථික අර්බුදයෙන් පසු, ශ්‍රී ලංකා ආර්ථිකය තාවකාලික ස්ථාවරත්වයක් පෙන්නුම් කරමින් සිටී. නිෂ්පාදන හා සේවා අංශයේ ආර්ථික පුනර්ජීවනය කෙරෙහි සහ සුභසාධන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ජනතාවට සමාජ ආරක්ෂාව සහතික කිරීම, ඉදිරි වසරවල දී ශ්‍රී ලංකාවට සමස්ත අභියෝගයක් බවට පත්ව ඇත. එහිදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විමධ්‍යගත විෂයයන් සඳහා පළාත් සභා ක්‍රමයේ ඵලදායී මැදිහත්වීම සහ දායකත්වය තීරණාත්මක හා අතවශ්‍ය කරුණක් බවට පත්ව ඇත.

මෙම තත්වයන් යටතේ, ජනතාවගේ ආර්ථික වර්ධනය සහ සමාජ යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාවලට මහ පෙන්වීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවට වඩාත් තීරණාත්මක කාර්යභාරයක් පැවරී ඇත. පවතින මූල්‍ය සීමාවන් හේතුවෙන් පළාත්වලට වෙන් කර ඇති සම්පත් සීමිත බැවින්, සංවර්ධන නිමැවුම් තිරසර ලෙස භාවිතා කිරීම සහතික කරමින් ද්විකරණය වීම වළක්වා ගනිමින් සම්පත් නාස්තිය වළක්වා ගැනීම සඳහා, සමස්ත පළාත් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා අතර නිසි සම්බන්ධීකරණය අවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, රටේ තිරසාර සංවර්ධනය කරා ළඟා වීම සඳහා ජාතික සහ පළාත් සභා අතර මැදිහත්කරුවෙකු ලෙස මුදල් කොමිෂන් සභාවට පහසුකම් සැලසීමට සිදු වේ.

පරිච්ඡේදය-03: 2024 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එසිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	කණ්ඩායම 2024	2023	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිමි		101,034,000	91,794,000	එසිඒ-3
-	කැන්පතු		142,220	617,496	එසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,998,693	3,917,880	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**105,174,913**	96,329,376	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**105,174,913**	96,329,376	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**892,132**	1,768,043	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**104,282,781**	94,561,333	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
62,910,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	61,617,586	55,698,302	
43,440,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	40,101,413	33,813,632	එසිඒ-2(ii)
650,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	613,158	652,131	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
107,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**102,332,157**	90,164,065	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
300,000	වැඩිදියුණු කිරීම්	10	-	132,315	
2,400,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,666,431	2,706,110	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13		-	
300,000	හැකියා වර්ධනය	14	297,505	239,825	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
3,000,000	මුළු මූලධන වියදම් (උ)		**1,963,936**	3,078,249	
	කැන්පතු ගෙවීම්		142,220	617,496	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		2,906,189	3,701,418	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**3,048,409**	4,318,914	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		107,344,502	97,561,228	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(3,061,721)	(2,999,895)	
	අයිමි ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(3,061,721)	(2,999,895)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අයිමි ශේෂය		-	-	එසිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	නත්‍ය	
		2024	**2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	807,288,825	800,266,003
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,201,144	9,293,648
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**815,489,969**	**809,559,651**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,201,144	9,293,648
දේපළ පිරියත හා උපකරණ සංචිතය		807,288,825	800,266,003
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**815,489,969**	**809,559,651**

පිටු අංක 07 සිට 26 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, රිට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	
තනතුර :	තනතුර :	නම :
දිනය : 20/02/2025	දිනය :	දිනය : 20/02/2025
ඒ.ටී.එම්.යූ.බී.බී. තෙන්නකෝන්		සන්ධ්‍යා කුඩුදිගී කොතලාවල
ලේකම්		ප්‍රධාන ගණකාධිකාරි
මුදල් කොමිෂන් සභාව		මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත		අංක 03, සරණ මාවත, රාජගිරිය
රාජගිරිය.		

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එසිඒ-සි

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්ෂ	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	3,139,735	2,652,986
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	101,034,000	91,794,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,826,779	4,151,714
තැන්පතු ලැබීම්	142,220	617,496
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**108,142,734**	**99,216,196**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	101,537,599	89,398,859
සහනාධාර සහ මාරුකිරීම්	613,158	652,131
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	892,132	1,768,043
අත්තිකාරම් ගෙවීම්	2,993,689	3,701,418
තැන්පතු ගෙවීම්	142,220	617,496
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**106,178,798**	**96,137,947**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,963,936**	**3,078,249**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	1,963,936	3,078,249
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,963,936**	**3,078,249**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(1,963,936)**	**(3,078,249)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(0)**	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙළ කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආක්‍රමණිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

8) 2023 වර්ෂයේ සංසන්ධනාත්මක තොරතුරු

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී හඳුනා ගන්නා ලද දෝෂයන් නිවැරදිකොට, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල සංසන්ධනාත්මක තොරතුරු ඉදිරිපත්කොට ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කළ ආදායම	
		මූලික	අවසාන	මුදල (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.02.99	පොලී ආදායම	-	-	372,835.78	-
2003.99.00	වෙනත් ආදායම්	-	-	392,585.02	-
2004.01.00	සේ.අ.අරමුදල	-	-	2,374,313.76	-

3.6 ප්‍රතිපාදන භාවිතා කිරීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කිරීම (රු.)		සත්‍ය වියම (රු.)	අවසාන ප්‍රතිපාදනයෙන් % ක් ලෙස ප්‍රතිපාදන භාවිතය
	මූලික	අවසාන		
පුනරාවර්තන ප්‍රාග්ධන	107,000,000 3,000,000	107,000,000 3,000,000	102,332,156 1,963,936	96% 65%

3.7 මු.රෙ.208 ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස පළාත් සභාවට, වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම.

අනුක්‍රමික අංකය	ප්‍රතිපාදන ලැබී ඇත්තේ කුමන අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමෙන්තුවෙන්ද?	වෙන්කිරීමේ අරමුණ	වෙන් කිරීම		සත්‍ය වියදම (රු.)	අවසාන ප්‍රතිපාදනයෙන් % ක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			මූලික	අවසාන		
-	අදාළ නොවේ	අදාළ නොවේ.	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024/12/31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය (රු.)	2024/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය (රු.)	තවමත් ගණන් ගත යුතුව ඇති	ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	449,009,540.32	449,009,540.32	-	-
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	100,279,285.02	100,279,285.02	-	-
9153	ඉඩම්	258,000,000.00	258,000,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9160	වැඩ කෙරෙමින් පැවතීම	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/C/FC/2/24/02

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 30 දින

මුදල් කොමිෂන් සභාව
30 MAY 2025
අංක 03, සරණ මාවත, රාජගිරිය.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

මුදල් කොමිෂන් සභාව

ශීර්ෂය 011 - මුදල් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 011 - මුදල් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මුදල් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මුදල් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණනය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කර නොතිබුණු අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) අංක 11- 1-1-2003 (වාහන) වැය විෂයය සඳහා මූලධන වියදම් යටතේ රු.300,000 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.8,245,000 ක් මු.රෙ. 66 යටතේ අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එය එම වැය විෂයයන්ගේ මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 127ක් දක්වා පරාසයක විය.

(ඇ) වැය විෂයයන් 04 කින් එකතුව රු.2,885,000 ක් වූ ප්‍රමාණයක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එය එම වැය විෂයයන්ගේ මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 80 ක් දක්වා පරාසයක විය.

3.2 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු බව දක්වා තිබුණද, 2024 වර්ෂයේදී අවස්ථා තුනකදී නිලධාරීන් වෙත ලබාදුන් එකතුව රු.170,000 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 13 සිට දින 48 ක් අතර කාල පරාසයක් ගතකර තිබුණි.

(ආ) නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අග්‍රිමයන් ලබා නොගත යුතු වුවද, අත්තිකාරම් මුදල් ලබාගෙන අදාල කාර්යය ඉටු නොකර දින 31 සිට දින 88 දක්වා කාලයක් අතේ රඳවාගෙන නැවත පියවා ඇති අවස්ථා 03 ක් විගණනයට නිරීක්ෂණය විය.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රචර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද විගණනයට ඉදිරිපත් කර තිබුනේ 2024 ජුනි 12 දින අනුමත කරන ලද 2024 වර්ෂයට අදාල ක්‍රියාකාරකම් (Activity) පමණක් ඇතුලත් කරන ලද සැලැස්ම පමණි.

(ආ) 2020 අගෝස්තු 08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි සඳහන් මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු මාර්ගෝපදේශ අංක 12(අ), 12(ඇ), 12(ඉ) සහ 12 (ඊ) හි කරුණු අන්තර්ගත වන සේ සකස්කර නොතිබුණි.

4.1.2 කාර්යභාරය ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ රටතුල ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම පිණිස පළාත් අවශ්‍යතා සඳහා ජාතික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කර ගැනීම හා එම අරමුදල් පළාත් නවය අතර බෙදාහැරීමට අදාල ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීම වන අතර මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව විසින් කාර්යයන් 08ක් ඉටුකල යුතුව තිබුණි.

එසේ වුවද ප්‍රාග්ධන ප්‍රදාන යටතේ යෝජිත සංවර්ධන සැලසුම් අනුමත කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා වෙත අරමුදල් ලබාදීම සිදුකලද, එම අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ අධීක්ෂණයු,සමාලෝචනය හා පසු විපරම් සිදුකර සැලසුමේ සඳහන් නිමවුම් හා ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමවේදයක්, වර්තමානයේදී වගකීම පැවරුණු ස්වායත්ත ආයතනයකින් හෝ පාර්ශවයකින් සිදු නොවන අතර ඒ පිළිබඳව දැක්විය යුතු නිර්දේශ, සමාලෝචිත වර්ෂයට අදාලව ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශ පිළිබඳ වාර්තාවේ සඳහන් වීමක් සිදු වී නොතිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය මඟින් 2022, 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මි.10,111 ක්, රු.මි.16,900 සහ රු.මි.25,500 ක් අයවැය මඟින් වෙන්කර දී තිබුණද ඊට අදාලව අක්මුදල් නිදහස් කිරීම් පිළිවෙලින් රු.මි.5,055ක්, රු.මි.8,600 ක් සහ රු.17,889 ක් හෙවත් අයවැය ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 50 ක්, සියයට 51 ක් සහ සියයට 72 ක් පමණක් විය.

මේ අනුව පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය ප්‍රතිපාදන ලබාදුන්නද ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් නොකිරීම නිසා සැලසුම්කල පරිදි පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වනවා මෙන්ම ප්‍රාදේශීය තුලිත සංවර්ධනය ඇති කිරීමේ අරමුණද ඉටුනොවන බව නිරීක්ෂණය කෙරේ.

4.2 ප්‍රසම්පාදනයන්

ශ්‍රී ලංකාව තුල රාජ්‍ය විදහුත් ප්‍රසම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිකුත් කර තිබූ 2024 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 08/2019 (ii) මඟින් 2023 අප්‍රේල් 19 දිනැති අංක 08/2019(i) හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 වෙත අවධානය යොමු කරමින්, මිල සැඳහුම් ක්‍රමය (Shopping Method) යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා e – Gp පද්ධතිය සංවර්ධනය කර ඇති බැවින් රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව හා සම්බන්ධීකරණ නිලධාරීන් e – Gp පද්ධතියේ ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම හා ප්‍රසම්පාදන ප්‍රදානයන් කිරීම, e – Gp පද්ධතිය හරහා සිදු කළ යුතුබව දක්වා තිබුණද, කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයේදී අවස්ථා 06 කදී එකතුව රු.905,765 ක් වූ භාණ්ඩ ප්‍රසම්පාදනයන් e – Gp පද්ධතිය භාවිත කිරීමෙන් තොරව සිදුකර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2024 දෙසැම්බර් 31 දිනට තොග පොත සහ CIGAS පරිගණක පද්ධතියෙහි ස්ථාවර වත්කම් යටතේ වන BOS Report එකිනෙක හා සැසඳීමේදී වත්කම් අයිතම 45 කට අදාලව වත්කම් 399 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) CIGAS මෘදුකාංගයේ සහ තොග පොතෙහි සඳහන් වත්කම් අයිතම නාමකරණ එකිනෙක හා නොගැලපීම් හේතුවෙන් CIGAS පද්ධතිය හරහා ලබාගන්නා වාර්තා භාණ්ඩ වට්ටෝරු පොත සමඟ සැසඳීමට නොහැකි විය.

(ඇ) 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ තාක්ෂණික භාණ්ඩ පිළිබඳ නිර්දේශ 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකරන අවස්ථාව වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර එය 2024 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ යටතේද ඇතුලත් කර තිබුණි.

(ඈ) 2024 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව භාණ්ඩ අයිතම 03ක අතිරික්තතා සංඛ්‍යාව 07ක් පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම I සිට ඇමුණුම X දක්වා වූ ආකෘතිපත්‍ර පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස්කල යුතු වුවද, මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයට අදාලව පිළියෙල කර තිබූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මෙම චක්‍රලේඛය ප්‍රකාරව සකස්කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 86 ක් වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 70 ක් වූයෙන් නිලධාරීන් 16 ක පුරප්පාඩු පැවතුණි. එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 37 ක් විය. මෙසේ පුරප්පාඩු පැවතීම කොමිෂන් සභාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකරව බලපාන්නේ නම් කඩිනමින් පුරප්පාඩු පිරවීම හෝ එසේ නොවන්නේ නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම සිදුකල යුතුබව නිරීක්ෂණය කෙරේ.

ඒ.ජී.ඒ. හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

පරිච්ඡේදය-04: කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90%- 100%	**75%-89%**	**50%- 74%**
පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා - 2025 තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා - 2025 තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
2025 වසර සඳහා පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම.	√		
2025 වසර සඳහා පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම.	√		
2025 වසර සඳහා නිර්දේශය ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.	√		
2025 වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.	√		
2025 වසර සඳහා පළාත් නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
පළාත් සංවර්ධන සැලසුම් - 2024 සමාලෝචනය කිරීම සහ එකඟතාව ලබා දීම.	√		
කාර්යාලයේ මූල්‍ය සහ පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම.	√		
මුදල් කොමිෂන් සභාවේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.	√		

පරිච්ඡේදය-05: තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසර සංවර්ධන ඉලක්ක

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ඉලක්ක ළඟා කර ගැනීම පිළිබඳ දර්ශක	මේ දක්වා ලබා ඇති ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
ඉලක්කය 1: සෑම තැනකම සෑම ආකාරයකින්ම දුප්පත්කම අවසන් කිරීම	1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. 1 a විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබා දීම කැපීපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම. 1.b දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම • නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ • පාසල් පෝෂණ ආහාර වැඩසටහන සඳහා මාර්ගෝපදේශ • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ			√ √ √ √ √ √

ඉලක්කය 8: තිරසාර ආර්ථික වර්ධනය සියලු දෙනාටම පූර්ණ හා ඵලදායී රැකියාවක් සහ යහපත් රැකියාවක් සමග ප්‍රවර්ධනය කිරීම	8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම			√ √ √ √
ඉලක්කය 10: රටවල් තුළ සහ රටවල් අතර අසමානතාවය අඩු කිරීම	10.3 ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩුදෙන්නා වූ නීති, ප්‍රතිපත්ති සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම			√ √ √ √

5.2 තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් පැහැදිලි කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සෘජුවම සංවර්ධන වැඩසටහන් ක්‍රියාක්මක නොකරන නමුත් සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් ඒ සඳහා පුළුල් පරාසයක විෂයන් ඔස්සේ සැලකිය යුතු දායකත්වය ලබා දේ. එනම්, පළාත්වල අවශ්‍යතා තක්සේරු කිරීම සිදු කර පළාත් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කර දීම සඳහා රජය වෙත නිර්දේශ ලබා දීම හා ඒ අනුව, වාර්ෂික අයවැයෙන් රජය විසින් වෙන් කරනු ලබන අරමුදල් ප්‍රාදේශීය තුලිත සංවර්ධනයක් අත් කර ගැනීමේ අරමුණින් පළාත් අතර බෙදා වෙන් කිරීම සහ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීමේදී

පළාත් සභාවල සංවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සමාජ, ආර්ථික සහ පාරිසරික අංශවල පුළුල් පරාසයක් තුළ පැතිර පවතින තිරසර සංවර්ධන ඉලක්ක බොහොමයක් පළාත් සභා වෙත පැවරී ඇති විෂයන්ට අදාළ වන අතර, පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මෙන්ම නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්හි තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධයෙන් පළාත් සභාවල අවධානය යොමු කරවනු ලබයි.

ඒ අනුව, පළාත් සභා විසින් පහත සඳහන් අංශ ඔස්සේ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරනු ලබන අතර, එම සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීමේදී ද තිරසර සංවර්ධන ඉලක්ක ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම පිළිබඳවද අවධානයට ලක් කරමින් අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා වෙත මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දේ.

* අධ්‍යාපන
* සෞඛ්‍ය
* දේශීය වෛද්‍ය
* ක්‍රීඩා
* පරිවාස හා ළමාරක්ෂණ
* සමාජ සේවා
* සංස්කෘතික හා ආගමික කටයුතු
* සමූපකාර සංවර්ධනය
* පූර්ව ළමාවිය සංවර්ධනය
* පළාත් මාර්ග
* වතු යටිතල පහසුකම්
* ප්‍රවාහන
* නිවාස
* ග්‍රාම සංවර්ධනය
* පළාත් පාලනය
  - පළාත් පාලන මාර්ග
  - ප්‍රජා ජල සැපයුම
  - කසළ කළමනාකරණය
  - වෙනත් සේවා
* ඉඩම් සංවර්ධනය
* වාරිමාර්ග
* කෘෂිකර්මය
* පශු සම්පත්
* මිරිදිය ධීවර
* කුඩා කර්මාන්ත
* සංචාරක කටයුතු
* ග්‍රාමීය විදුලිය
(පළාත් සභා ලැයිතුවේ අංක 34 අයිතමයෙහි විෂය සීමාව තුළ)

කෙසේ වුවද, මුදල් කොමිෂන් සභාව විසින් රජයේ වාර්ෂික අයවැයෙන් පළාත් සභා සඳහා වෙන් කිරීමට නිර්දේශ කරනු ලබන අරමුදල් ප්‍රමාණයට සාපේක්ෂව, පවත්නා සීමිත සම්පත් හේතුවෙන් රජය විසින් පළාත් සභා සඳහා වාර්ෂිකව වෙන් කෙරෙනුයේ අඩු අරමුදල් ප්‍රමාණයක් බැවින්, ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම අභියෝගයක් වේ.මේ හේතුවෙන් පුහුණු හා පළපුරුදු කාර්යමණ්ඩලයක් පළාත් සභා සතු වුව ද ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම නිසා අපේක්ෂිත සංවර්ධන කටයුතු සීමා කිරීමට පළාත් සභාවලට සිදුව ඇති අතර, එය තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී බලපෑම් ඇති කරනු ඇත.

තවද, ප්‍රාදේශීය මට්ටමේ විෂමතා අවම කරමින් සියළු පුරවැසියන්ට සංවර්ධන ප්‍රතිලාභ ලැබෙන පරිදි ආර්ථික සංවර්ධනයට දායකවීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව හඳුනාගත් මූලධර්මයන් මත පදනම්ව සකසන ලද විද්‍යාත්මක ක්‍රමවේදයකින් පළාත් අතර අරමුදල් වෙන් කිරීම සඳහා රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුව ද, පළාත් සභා වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් රේඛීය අමාත්‍යාංශ හරහා වෙන් වීමත්, එකී අරමුදල් භාවිතයේදී එම ආයතන විසින් ඉහත ආකාරයේ විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය නොකිරීමත් හේතුවෙන් රට තුළ තුළිත ප්‍රාදේශීය සංවර්ධනය මෙන්ම තිරසර ඉලක්ක ප්‍රගස්ත මට්ටමින් ළඟා කර ගැනීමේදී අභියෝගයක්ව පවතී.

පරිච්ඡේදය-06: මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව **(31.12.2024)**	**(පුරප්පාඩු / අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	16	09	07
තෘතීයික	05	04	01
ද්විතියික	47	33	14
ප්‍රාථමික (MDTF ඇතුළත්ව)*	18	14	04

***MDTF-බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය**

6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපා ඇති ආකාරය කෙටියෙන් දක්වන්න

මුදල් කොමිෂන් සභාවේ දැනට සිටින කාර්ය මණ්ඩලයට එහි ක්‍රියාකාරී සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉටු කිරීමට අමතර පැය ගණනක් වැඩ කිරීමට සිදු වේ. කෙසේ වෙතත්, සිටින කාර්ය මණ්ඩලය සඳහා තිබෙන ඉහළ වැඩ ප්‍රමාණය, නිමැවුමේ ගුණාත්මක භාවයට බලපෑ හැකිය. ඒ අතරම, නිලධාරීන්ගේ ධාරිතාව සීමිත බැවින් ක්‍රියාකාරී සැලැස්මේ කාලසීමාවන් සපුරාලීම සමහර විට අභියෝගයකි.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
				දේශීය(රු)	විදේශීය(රු)		
01	රාජ්‍ය අංශයේ මානව සම්පත් පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මාලාව - අදියර 1	02	දින 05	-	-	දේශීය	රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම.
02	රජයේ දේපළ	01	01	7,000.00	-	දේශීය	පොදු දේපළ කළමනාකරණය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
03	අත්තිකාරම් "B" ගිණුම	01	01	7,000.00	-	දේශීය	අත්තිකාරම් "B" ගිණුම භාවිතා කරන ආකාරය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම.
04	කාර්ය මණ්ඩල වැඩසටහන (කාර්යාල ජීවිතයෙන් ඔබ්බට)	48	දින 01	4,000.00	-	දේශීය	කාර්යාල ජීවිතයෙන් ඔබ්බට ආකල්ප හා කුසලතා වර්ධනය කර ගැනීම.
05	රජයේ නිලධාරීන්ගේ සේවාලාභී සත්කාරය	45	දින 01	4,800.00	-	දේශීය	සේවාලාභී ආගන්තුක සත්කාර පිළිබඳ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම
06	කාර්ය මණ්ඩල වැඩසටහන (නව විගණන පනත පිළිබඳ දැනුවත් කිරීම)	48	දින 01	3,600.00	-	දේශීය	විගණන පනත පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
07	ඉංග්‍රීසි ඩිප්ලෝමාව	01	අවු. 01	60,000.00	-	දේශීය	රාජකාරී කටයුතු කිරීම සඳහා ඉංග්‍රීසි දැනුම වැඩිදියුණු කිරීම

08	ආයතනික වැඩ ක්‍රියාපටිපාටි පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව	01	මාස 04	36,000.00	-	දේශීය	ආයතනික වැඩ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
09	ලේකම් කාර්යාල වැඩ පිළිබඳ පරිචයන්	01	දින 04	25,000.00	-	දේශීය	කාර්යාලයේ ලේකම් අංශ කටයුතු පිළිබඳ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම.
10	රජයේ වැටුප් ක්‍රමය	01	දින 03	18,000.00	-	දේශීය	රජයේ වැටුප් ක්‍රමය පිළිබඳ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම.
11	ඉංග්‍රීසි ඩිප්ලෝමාව	01	අවු. 01	46,000.00	-	දේශීය	රැකියා කටයුතු සඳහා ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කිරීම.
12	කාර්යාල කාර්ය සහායකයින්ගේ යුතුකම් සහ වගකීම්	03	දින 02	39,000.00	-	දේශීය	කාර්යාල සේවක සහායකයින්ගේ රාජකාරි සහ වගකීම් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම.
13	ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම	01	දින 19	-	124,464.37	විදේශීය	ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සහ ශ්‍රම්ක ප්‍රමිතීන් පිළිබඳ දැනුම ලබා ගැනීම.
14	ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා වෘත්තිකයන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන	01	දින 15	-	110,623.77	විදේශීය	වෘත්තීය සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය.
15	ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා වෘත්තිකයන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන	01	දින 15	-	110,623.77 රු.30,096.25 (උණුසුම් ඇඳුම් දීමනාව)	විදේශීය	වෘත්තීය සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය.
16	Seminar on governance capacity and social development for belt and Road countries	01	දින 09	-	114,874.88	විදේශීය	කාර්යක්ෂමව හා ඵලදායී ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා දැනුම සහ ධාරිතාව වැඩි දියුණු කිරීම.

17	First mid career training programme for Island service officers	01	දින 12	-	99,459.75	විදේශීය	ඉන්දියාවේ පරිපාලන ව්‍යුහය සහ රාජ්‍ය අංශයේ සේවා සැපයීමේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරන ආකාරය පිළිබඳ සමස්ත දැනුම.
18	24 වන ගෝලීය ළමා පෝෂණ සංසදය	01	දින 04	-	28,235.17 (උණුසුම් ඇඳුම් දීමනාව)	විදේශීය	ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීම.

පරිච්ඡේදය-07: අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් පැවරීම කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල අධිකාරිය පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2), DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන අපහරණය වී මාස 06 කට වඩා අඩු කාලයක දී බැහැර කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	2017.09. 20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාළ නොවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අදාළ නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාළ නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.